シンハラ語

# "ජපන් තැපැල් නේවාසික කාඩ්පත් කියවීමේ යෙදුම" වෙතින් ඔබ ජපානයේ රැඳී සිටින කාල සීමාවේ කල් පිරීමේ දිනය යාවත්කාලීන කළ හැකිය!

## [ඉලක්කගත ගනුදෙනුකරුවන්]

- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හෝ ජපන් පෝස්ට් ඩිරෙක්ට් (මාර්ගගත බැංකු සේවා) භාවිතා කරන විට ජපානයේ රැඳී සිටින කාලය වැනි තොරතුරු යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් පණිවිඩයක් ලැබෙන පුද්ගලයින්
- නේවාසික කාඩ්පත යාවත්කාලීන කළ පුද්ගලයින්

## [ක්‍රියා පටිපාටියෙහි අනුපිළිවෙල]

① වෙබ් අඩවියට පිවිසීම※ → ② යෙදුම බාගත කරගැනීම → ③ නම් දරන්නාගේ තොරතුරු ආදිය ඇතුළත් කිරීම → ④ නේවාසික කාඩ්පත් කියවීම → ⑤ පිළිතුර

※ජපන් තැපැල් බැංකු පාරිභෝගික තොරතුරු ප්‍රකාශන අඩවිය

[සූදානම් කරගත යුතු දේවල්]

1. ස්මාර්ට් ජංගම දුරකතනයක්
2. ඔබගේ වලංගු නේවාසික කාඩ්පත
3. ජපන් තැපැල් නේවාසික කාඩ්පත් කියවීමේ යෙදුම

[සැලකිලිමත් විය යුතු කරුණු]

- ඔබ ලබා දුන් තොරතුරු යාවත්කාලීන වීමට සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, ජපන් පෝස්ට් ඩිරෙක්ට්, ජපන් තැපැල් පාස් පොත් යෙදුම ආදියෙන් පණිවිඩ ඉවත් කිරීමට යම් කාලයක් ගත විය හැක (සති 1 සිට 2 දක්වා) .
- ඔබට ස්මාර්ට් ජංගම දුරකතනයක් නොමැති නම්, කරුණාකර ඔබගේ ප්‍රාදේශීය තැපැල් කාර්යාල ඉතුරුම් කවුළුවට හෝ ජපන් තැපැල් බැංකු කවුළුව මඟින් ක්‍රියාපටිපාටිය සිදු කරන්න.
  (රැගෙන යා යුතු දේවල්) • පාස්පොත හෝ මුදල් කාඩ්පත
  • ඔබගේ වලංගු නේවාසික කාඩ්පත

○ විමසීම්

පාරිභෝගික සේවා තොරතුරු කළමනාකරණ මධ්‍යස්ථානය
0120-340-004 (ගාස්තු රහිත ඇමතුම්)
ඇමතුම් ලබා දිය හැකි වේලාවන්:
සතියේ දිනවල 9:00-19:00
සෙනසුරාදා,ඉරිදා සහ නිවාඩු දිනවල 9:00 -17:00
- දෙසැම්බර් 31 සිට ජනවාරි 3 දක්වා මෙම සේවාව ලබාගත නොහැක

- ඉංග්‍රීසි, චීන, කොරියන්, වියට්නාම් භාෂාවන්ගෙන් සේවාව ලබාගත හැකිය.
- දුරකතන ඇමතුම ගැනීමට පෙර කරුණාකර දුරකථන අංකය හොඳින් පරීක්ෂා කරන්න. අතපසුවීම් නොවීමට වග බලා ගන්න.
- ජංගම දුරකථන ආදියෙන්ද නොමිලේ ඇමතුම් ලබා ගත හැක.
- IP දුරකථන වැනි ඇතැම් සේවාවන් නොතිබිය හැකිය.

ご相談はお近くの郵便局の貯金窓口・ゆうちょ銀行へ 郵便局

お問い合わせ先

2024年8月現在

広告承認番号：E240827-24070

## ① වෙබ් අඩවියට පිවිසීම



පහත ද්විමාන කේතය භාවිතයෙන් "ජපන් තැපැල් බැංකු පාරිභෝගික තොරතුරු ප්‍රකාශන අඩවිය (ゆうちょ銀行お客さま情報ご申告サイト)" වෙත පිවිසෙන්න.



සංකේත අංකය ඇතුළත් කරන්න



ප්‍රකාශන අන්තර්ගතයේ "රැඳී සිටීමේ කාලය කල් පිරෙන දිනය ප්‍රකාශ කිරීම (在留期間満了日のご申告)" තෝරන්න.



"ප්‍රකාශන විස්තර ඇතුළත් කිරීමට ඉදිරියට යන්න (ご申告内容の入力に進む) " ලෙස තෝරන්න.

## ② "ජපන් තැපැල් නේවාසික කාඩ්පත් කියවීමේ යෙදුම" බාගත කරගැනීම



යෙදුම් ගබඩාවට (ඇප් ස්ටෝර්) ගොස් යෙදුම බාගත කරගන්න.



"බාගත කරගැනීම සම්පූර්ණයි (ダウンロード完了)" තෝරන්න.

ඔබ දැනටමත් යෙදුම බාගත කර ඇත්නම්, තිරයේ පහළම ඇති "බාගත කර ගැනීම සම්පූර්ණයි (ダウンロード完了)" තෝරන්න.

## ③ නම් දරන්නාගේ තොරතුරු ආදිය ඇතුළත් කිරීම



දී ඇති උපදෙස් අනුගමනය කරමින් නම, උපන් දිනය යනාදිය ඇතුළත් කරන්න.



නේවාසික කාඩ්පතේ සඳහන් වී ඇති තොරතුරු ඇතුළත් කරන්න.



කැමරාවෙන් ලබාගත් ඡායා රූපයක් හෝ ඔබගේ ස්මාර්ට් ජංගම දුරකතනයේ ගබඩා කරන ලද ඡායාරූපයක් උඩුගත කරන්න.



"ඊළඟ (次へ)" යන්න තෝරන්න.

## ④ නේවාසික කාඩ්පත් කියවීම



ඔබ ඇතුළත් කළ තොරතුරු පරීක්ෂා කර, යම් දෝෂයක් තිබේ නම්, "නිවැරදි කිරීම (修正する)" තෝරන්න. දෝෂ නොමැති නම්, "STEP 6 වෙත යන්න" තෝරන්න.



“නේවාසික කාඩ්පත් කියවීමේ යෙදුම දියත් කරන්න (在留カード読取アプリを起動)" යන්න තෝරන්න.



භාෂාව තෝරා "ඊළඟ (次へ) " යන්න තෝරන්න.



රෙගුලාසි ආදිය පරීක්ෂා කර එම ස්ථාන 2කෙහිම හරි ලකුණ යොදන්න.



"ඊළඟ (次へ)" යන්න තෝරන්න.



ඔබේ නේවාසික කාඩ්පත් අංකය ඇතුළත් කර "ඊළඟ (次へ)" යන්න තෝරන්න.



ඔබගේ ස්මාර්ට් ජංගම දුරකථනය නේවාසික කාඩ්පත මත තබා "කියවීම අරඹන්න (読み取り開始)" යන්න තෝරන්න.



「OK」යන්න තේරීම් කල පසුව වෙබ් බ්‍රවුසරයට මාරු වේ.

## ⑤ පිළිතුර



ටැබය "පාරිභෝගික තොරතුරු ප්‍රකාශන අඩවිය" වෙත මාරු කරන්න



සම්පූර්ණ කිරීමට "පිළිතුර (回答する)" යන්න තෝරන්න.